8 ශ්‍රේණිය සිංහල

02 ඒකකය - 2022

රබීන්ද්‍රනාත් තාගෝර් හා බහුගේ නිර්වාණ

සැකසුම - හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

08 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

02. රබීන්ද්‍රනාත් තාගෝර් හා ඔහුගේ නිර්මාණ



රබීන්ද්‍රනාත් තාගෝර් (බෙංගාලි බසින් රබීන්ද්‍රනාථ ඨකුර) (1861-1941) නූතන ඉන්දියානු සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පුරෝගාමියා සේ සැලකෙයි. සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය දිනා ගත් ප්‍රථම ආසියාතිකයා වන්නේ රබීන්ද්‍රනාත් තාගෝර් ය.

ඉන්දියාව සිය ජාතික ගීය වශයෙන් පිළිගෙන ඇත්තේ ද රබීන්ද්‍රනාත් තාගෝර්ගේ නිර්මාණයකි. කුසුම් දිසානායකගේ "ගීතාංජලී" නම් පරිවර්තනය ඇසුරෙන් මෙම ලිපිය සකස් කර ඇත.

අරුත් පැහැදිලි කිරීම

- ✓ සමාජ ප්‍රගතිය - සමාජයේ ඉදිරි ගමන/දියුණුව
- ✓ ආචීර්ණ කල්පිත - යල් පිනූ/කල් ගිය/ඉපැරණි යුගයට අයත්
- ✓ පෘථුල - පුළුල්
- ✓ දේශමාමකත්වය - තම රට පිළිබඳ හැඟීම
- ✓ උපනිෂද් - හින්දු ධර්ම ග්‍රන්ථයකි. ගුරුවරයා සමීපයේ සිට ඉගෙන ගන්නා ධර්මයකි.
- ✓ පුරාණෝක්ති - පැරණි කියමන්
- ✓ ජන්මෝත්සවය - උපන් දින උත්සවය

අවබෝධය

1. රබීන්ද්‍රනාත් තාගෝර්ට නොබෙල් සාහිත්‍ය සම්මානය හිමි කර දුන් කෘතිය කුමක් ද?
2. ළාබාල වියේ දී ඔහු කියවූයේ කිනම් ලේඛකයන්ගේ පොත් ද?
3. 'සාධනා' නමින් සංග්‍රහ කෙරුණේ මොනවා ද?
4. තාගෝර් රන් පොතට ලිපියක් සැපයූ ප්‍රකට විද්‍යාඥයා කවුද?
5. තාගෝර්ගේ අදීනත්වය පළ කරන එක් අවස්ථාවක් ඉහත පාඩමෙන් උපුටා දක්වන්න.

- **අවබෝධය**

1. ගීතාංජලී.
2. වාල්මිකීගේ රාමායණය, කාලිදාසගේ නාට්‍ය, ශේක්ස්පියර්ගේ ශෝකාන්ත නාට්‍ය, ජයදේවගේ ගීතගෝවින්දය.
3. එංගලන්තයේ සිට ඇමරිකාවට ගිය තාගෝර්, චිකාගෝ හා හාවර්ඩ් විශ්වවිද්‍යාලවලදී පැවැත්වූ දේශන.
4. අයින්ස්ටයින්.
5. යුද්ධයෙන් පසු කාලය, තාගෝර් මහත් චිත්ත සන්තාපයට පත් කළ කාලයක් විය. ඔහු තම නයිට් පදවිය අත් හළේ ය. ඒ නම්බු නාමය අත් හරිමින් ඉංග්‍රීසි ආණ්ඩුකාරයාට යැවූ ලිපිය ඔහු තුළ පැවති අභිමානයත් දේශමාමකත්වයත් පෙන්වයි.

ප්‍රායෝගික අභ්‍යාස

1. රබීන්ද්‍රනාත් තාගෝර්ගේ ජීවන තොරතුරු හා එතුමාගේ නිර්මාණ අලළා බිත්ති පුවත්පතක් සකස් කරන්න. පසුව විශ්ව භාරතී විශ්වවිද්‍යාලය බවට පත් වූ ශාන්ති නිකේතනය පිළිබඳ තොරතුරු රැස් කරන්න.
2. රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කාව්‍ය සංකල්පනා ඇසුරෙන් සම්පාදනය වූ සිංහල ගීත කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
3. සිංහලට පරිවර්තනය වූ රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කෙටිකතා එකතු කර ඒවායේ සාරාංශයක් පන්තියට ඉදිරිපත් කරන්න.
4. ශාන්ති නිකේතනය සෙවණේ බිහි වූ ශ්‍රී ලාංකිකයන්ගේ ලේඛනයක් සකස් කර ඔවුන් නියෝජනය කරන විෂය ක්ෂේත්‍ර ඉදිරියෙන් දක්වන්න.

රබීන්ද්‍රනාත් තාගෝර්

- ✓ උපන් දිනය : 1861 මැයි 07
- ✓ ජාතිය : බෙංගාලි
- ✓ පියා : දේවේන්ද්‍රනාත් තාගෝර්
- ✓ පවුල් පසුබිම : ඉන්දියාවේ ඇති වූ ආගමික, සාමාජික හා දේශපාලනික ව්‍යාපාරවල පුරෝගාමී ව කටයුතු කළ තාගෝර් පරපුරෙන් පැවත එයි.
- ✓ අධ්‍යාපනය : පාඨශාලා අධ්‍යාපනයට යොමු නො වූ මෙතුමා නිවසේ දී ම සංස්කෘත හා ඉංග්‍රීසි භාෂාව හදාළේ ය. වැඩිදුර අධ්‍යාපනය සඳහා වයස අවුරුදු 17 දී එංගලන්තය බලා පිටත් විය.

✓ සාහිත්‍ය නිර්මාණ :

එංගලන්තයට යෑමට පෙර 'කබි කහානි' (කවියාගේ කතාව) නමැති කෘතිය ද 'භග්න හෘද' නම් නාට්‍ය පෙළ ද රචනා කොට තිබිණි. එංගලන්තයේ අධ්‍යාපනය ලැබීමෙන් අනතුරු ව තම රටට පැමිණි තාගෝර්තුමා විසින් 1882 දී 'සන්ධ්‍යා සංගීත්' කෘතිය ද 1883 දී 'ලිත් සංගීත්' නමැති කෘතිය ද පළ කරන ලදි. 'සොබා දහමේ 'පළිගැනීම'නමැති නාට්‍යය විචාරක අවධානය දිනා ගත් නිර්මාණයකි.

''ස්මරන් කාව්‍යය'' බිරිඳගේ මරණයෙන් පසු ලියන ලද්දකි. 'කථිඕ කාහිනී' 'නෛවේදසා' , කන්තෝරුව, 'අඳුරු කුටියේ' රජතුමා' යන කෘති ද, රබීන්ද්‍රනාත් තාගෝර් විසින් රචිත ය.

ඔහුගේ 'ගීතාංජලී' කාව්‍යය පාඨක හා විචාරක අවධානයට යොමු වූ නිර්මාණයකි. රබීන්ද්‍රනාත් තාගෝර්තුමාට නොබෙල් ත්‍යාගය හිමි වූයේ මෙම 'ගීතාංජලී' කාව්‍යය වෙනුවෙනි.

✓ අභාවය : 1941. අගෝස්තු 07

මං සදන්නන් ගල් කඩන තැන
බිම් කොටන්නන් සරන වැඩ බිම
දූලි තැවරුණු සළු දරා ගෙන
අව්වෙ වැස්සේ සිටිති දෙවියෝ

විමුක්තිය ගැන සිතනු කුමකට
කොයිබදෝ එය තිබෙන්නේ?
ඔබේ පිරිසිදු ඇඳුම හැර දා
පොළොව මත පා තබන්නේ

සොම්නසින් ලොව මවන මහ බර
අප පියාණන් දරන්නේ
තමා නිමැවුම් වෙත බැඳී ඔහු
සදා අප හා වෙසෙන්නේ

සුවඳ දුම් මල් ඉවත ලන්නේ
බවුන් වඩනේ කුමට දෝ
අනගි සළු පිළි ඉරී ගිය වුව
දූලි වැකුණ ද කිමෙක් දෝ

ගතේ වෙහෙසෙන් නළල් තලයේ
නැගෙන ඩා බිඳු සමග එනු මැන
හමුව දෙවියන් කෙතෙහි වැඩ බිම
සදා එතුමන් හා සිටිනු මැන

ගීතාංජලී - රබීන්ද්‍රනාත් තාගෝර්
පරිවර්තනය - කුසුම් දිසානයක

නෙළනු මැන මේ කුඩා පුෂ්පය
පමා නොවනුය නෙළා ගනු මැන

පමා වුවහොත් වියළි යනු ඇත
බිම රජස් මත වැටී යනු ඇත.

ඔබේ ගෙලවල මල් දමෙහි එය
නො ලැබුවත් කිසියම් තැනක්
ඔබේ අත් පහසින් පුදා එය
නෙළා ගනු මැන පමා නොම වී

මට හොරා දින ගෙවී යනු ඇත
ඔබ පුදන කල ඉකුත් වනු ඇත
බියෙකි මා සිත නෙළනු මැන මල

පැහැය ලා වුව සුවඳ මඳ වුව
සේවයෙහි ඔබේ යොදා ගනු මැන
කල් තියා එය නෙළා ගනු මැන

ගීතාංජලී - රබීන්ද්‍රනාත් තාගෝර්
පරිවර්තනය - කුසුම් දිසානායක

අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර

- නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර 18ක් සහ ව්‍යඤ්ජන අක්ෂර 42ක් අන්තර්ගත වන අතර අන්තර්ගත මුළු අක්ෂර ගණන 60කි.
- ස්වර අක්ෂර 18න් අක්ෂර 8ක් කෙටි/ හ්‍රස්ව ස්වර වේ.

අ	ඇ	ඉ	උ	ඍ	ඌ	එ	ඔ

- ස්වර අක්ෂර 18න් අක්ෂර 10ක් දීර්ඝ ස්වර වේ.

ආ	ඈ	ඊ	ඌ	ඎ	ඏ	ඒ
ඕ	ඖ	ඕ				

- ව්‍යඤ්ජන අක්ෂර 42න් අක්ෂර 10ක් අල්පප්‍රාණ අක්ෂර වේ.

ක	ච	ට	ත	ප	ග	ජ
ඩ	ද	බ				

- ව්‍යඤ්ජන අක්ෂර 42න් අක්ෂර 10ක් මහාප්‍රාණ අක්ෂර වේ.

ඛ	ඡ	ඨ	ඵ	ඵ	ඝ	ඣ
ඪ	ධ	භ				

- අක්ෂර උච්චාරණයේ දී වේගයෙන් හා වැඩි ප්‍රාණයකින් හඬ හා වායුව පිට කිරීමෙන් මහාප්‍රාණ ශබ්ද උපදී. එසේ නොමැති ව අඩු වේගයකින් අඩු ප්‍රාණයකින් හඬ හා වායුව පිට කිරීමෙන් අල්පප්‍රාණ ශබ්ද උපදී.
  උදා -

I. **අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය අර්ථ භේදයට හේතු වන අවස්ථා**

✓ දන (ජනයා)	ධන (ධනය)
✓ දනු (දැන, ගනු)	ධනු (දුන්න)
✓ බට (නලය)	භට (හේවා)
✓ ප්‍රදාන (ප්‍රදානය)	ප්‍රධාන (මූලික)

II. **අල්පප්‍රාණ - මහාප්‍රාණ අල්පප්‍රාණ - මහාප්‍රාණ සාවද්‍ය භාවිතය**

<u>නිරවද්‍ය යෙදීම</u>	<u>සාවද්‍ය යෙදීම</u>
✓ සමස්ත	සමස්ථ
✓ වාර්තා	වාර්ථා
✓ මර්දන	මර්ධන
✓ පරිවර්තන	පරිවර්ථන
✓ විශිෂ්ට	විශිෂ්ඨ
✓ දෘෂ්ටි	දෘෂ්ඨි
✓ පුස්තකාලය	පුස්ථකාලය

III. අල්පප්‍රාණ - මහාප්‍රාණ අල්පප්‍රාණ/මහාප්‍රාණ විකල්ප භාවිත

- ✓ කථා - කතා (ප්‍රබන්ධ කථා, බණ කතා)
- ✓ අවධිය - අවදිය
- ✓ අභිමාන - අබිමාන
- ✓ සුභ - සුබ)

ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් අල්පප්‍රාණ අක්ෂර යෙදුණු පද හා එම අක්ෂරවල මහාප්‍රාණ අක්ෂර යෙදුණු පද උච්චාරණය කරන්න.

අල්පප්‍රාණ අක්ෂරය සහිත වචන	මහාප්‍රාණ අක්ෂරය සහිත වචන
ප්‍රදාන	ප්‍රධාන
නිදාන	නිධාන
අරුත	අර්ථ
ගණ	ඝන
අබරණ	ආභරණ
අබිබවා	අභිභවා
ස්තූපය	ථූපය
මදුරු	මධුර
භය	බය
පතන	ප්‍රාර්ථනා
සින්දු	සින්ධුර

2. පහත සඳහන් පදවල හිස්තැනට යෙදිය යුතු අකුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. වර්__නය (ද, ධ)
ii. මර්__නය (ද, ධ)
iii. පරි__ණකය (ග, ඝ)
iv. සං__යනාව (ගා, ඝා)
v. ලේ__ම් (ක, ඛ)
vi. ලේ__කයා (ක, ඛ)
vii. අර්__ද (බු, භු)
viii. ප්‍රති__ල (ළ, ප)
ix. මජ්__ම (ජ, ඣ)
x. සාකච්__ව (චා, ඡා)
xi. ශිෂ්__චාරය (ඨා, ටා)
xii. ප්‍රෞ__(ඩ, ඪ)
xiii. කණ්__ජ (ට, ඨ)
xiv. මූර්__ජ (ධ, ජ)
xv. සුබෝප__ගී (භෝ, බෝ)

3. අදාළ කොටු දෙකෙහි ඒ ඒ අක්ෂරය යෙදුණු වචන දෙක බැගින් ලියන්න.

		ඨ	ඛ		
		ඝ	ඪ		
		ඡ	ඵ		
		ඣ	ධ		
		භ	ථ		

- **ලිඛිත අභ්‍යාස**

1. √

2.

I. වර් ධ නය (ද, ධ)
II. මර් ද නය (ද, ධ)
III. පරි ග ණකය (ග, ඝ)
IV. සං ගා යනාව (ගා, ඝා)
V. ලේ ක මි (ක, ඛ)
VI. ලේ ඛ කයා (ක, ඛ)
VII. අර් බු ද (බු, භු)
VIII. ප්‍රති ඒ ල (ඒ, ප)
IX. මජ් ඣි ම (ජි, ඣි)
X. සාකච් ඡා ව (චා, ඡා)
XI. ශිෂ් ටා චාරය (ඨා, ටා)
XII. ප්‍රෞ ඪ (ඩ, ඪ)
XIII. කණ් ඨ ජ (ට, ඨ)
XIV. මූර් ධ ජ (ධ, ජ)
XV. සුඛෝප හෝ ගී (හෝ, ඛෝ)

3.

I. ඨ - ඨපනීය, කොට්ඨාස, ශ්‍රේෂ්ඨ
II. ෂ - ෂණ්ටා, දීර්ඝ, මාෂ
III. ඡ - ඡන්දය, ස්වච්ඡය, සාකච්ඡා
IV. ඣ - ඣංකාර, මජ්ඣිම
V. භ - භය, ආභරණ, ක්ෂෝභ
VI. ඛ - ඛණ්ඩ, ලේඛන, රේඛා

VII. ඪ - රූඪී, ආෂාඪ, දෘඪතර
VIII. ඵ - ඵල, නිෂ්ඵල, රේඵය
IX. ධ - ධවල, ක්‍රෝධය, වෘද්ධ
X. ථ - ථූප, ප්‍රථම, අවස්ථා
XI. කැපුවා වාගේ.
XII. තැළෙන යකඩෙ දැක්කම ආචාරියා උඩ පැන පැන තළනවලු.
XIII. තටු හැළුණු පක්ෂියා වගෙයි.
XIV. ආරේ ගුණ නෑරේ.

ශුරු අත් පොතෙන්

1. අසා ලිවීම.

I. දර්ශනය
II. ප්‍රදර්ශනය
III. ලේඛනය
IV. වළල්ල
V. කසල
VI. තරුණයා
VII. පරීක්ෂණය
VIII. බළලා
IX. වරල
X. පළලයි.

2. අසා ලිවීම.

I. ලේකම්
II. ඛනිජ
III. ශීඝ්‍රගාමී
IV. විශිෂ්ට
V. ආගාධය
VI. ගාථාව
VII. සභාව
VIII. ප්‍රතිඵල
IX. අපලය
X. බාධාව

3. පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අකුර රවුමෙන් තෝරා ලියන්න.

I. ආදර් ..... ය - ආදර්ශය
II. ප්‍රදර්..... නය - ප්‍රදර්ශනය
III. කාර ..... ය - කාරණය
IV. පර .... - පරණ
V. දේශ ..... ය - දේශනය
VI. .... මයා - ළමයා
VII. හා ..... - හාන
VIII. කර ..... - කරන/ කරණ
IX. කකු ..... - කකුල
X. පත..... - පතන/ පතල/ පතළ



4. හිස්තැනට සුදුසු අකුර ඉදිරියේ ඇති රවුමෙන් තෝරා ලියන්න.

I.	අ ..... ල	- අගල
II.	කැ	- කැඳ
III.	ක ..... ය	- කඩය/ කඹය
IV.	හ	- හඳ/ හඬ
V.	ක ..... ල	- කඳුල/ කඩල
VI.	ඇ .... ය	- ඇඳය
VII.	හෙණ් ..... ව	- හෙණ්ඩුව
VIII.	ඇ ..... ම	- ඇඳුම
IX.	ස .... ල	- සඟල
X.	ඇ ..... ලය	- ඇඹලය



ගුණාත්මක යෙදවුම්

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ කාව්‍ය නිර්මාණ
- රබීන්ද්‍රනාත් තාගෝර්තුමා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව ලියන ලද ලිපි - හඬ (ගුවන් විදුලි සඟරාව) - 2011 අප්‍රේල් - ජූනි කලාපය
- ගීතාංජලි - රබීන්ද්‍රනාත් තාගෝර් (පරිවර්තනය - කුසුම් දිසානායක)

NALANDA VIDYALAYA

නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

8 ශ්‍රේණිය | **සිංහල භාෂාව** | **ඒකකය: 2 - රබීන්ද්‍රනාත් තාගෝර් හා ඔහුගේ නිර්මාණ**

1) **පිළිතුරු ලියන්න.**

(1) රවීන්ද්‍රනාත් තාගෝර්ගේ උපත

(2) එතුමාගේ මුත්තණුවන් ගේ නම

(3) එතුමාගේ පියාණන් ගේ නම

(4) කවියෙකු වශයෙන් තාගෝර්ගේ ප්‍රසිද්ධිය තහවුරු කළ කෘතිය කුමක් ද?

(5) ඔහුගේ ප්‍රථම නාට්‍යය

(6) ඔහුගේ කෘති අතරින් පරිසමාප්ත කෘතිය

(7) ඔහු විසින් අරඹන ලද නිකේතනයේ නම
එය අරඹන ලද වර්ෂය

(8) ඔහු තුළ වූ දැඩි ශෝකය ප්‍රකාශ කරන කාව්‍යය

(9) ඔහු තුළ තිබූ දැඩි දේශමාමකත්වය පෙන්නුම් කරන කාව්‍ය සහ නාට්‍යය

(10) ''ගීතාංජලිය'' යන කාව්‍ය තුළ ඇතුළත්වන සංකල්ප

(11) තාගෝර්ට එංගලන්තයේ දී හමු වූ ඉංග්‍රීසි ලේඛකයින්

(12) තාගෝර් චිකාගෝ සහ හාවර්ඩ් විශ්ව විද්‍යාලවල පැවැත්වූ දේශන ඇසුරින් සැකසූ කෘතිය

(13) එතුමාට නොබෙල් ත්‍යාගය හිමි වූ වර්ෂය

(14) එතුමාට නයිට් පදවිය හිමි වූ වර්ෂය

(15) 1921 දී ශාන්ති නිකේතනය නම් කෙරුණේ කුමක් ලෙස ද?

(16) තාගෝර් ලංකාවේ පිහි වූ ආයතනය

(17) තාගෝර් ගේ අවසාන විදේශ සංචාරය කොහේ ද? ..... වර්ෂය ?

(18) එතුමාට සාහිත්‍යය පිළිබඳ ආචාර්ය උපාධියක් පිරිනැමුණු වර්ෂය

(19) තාගෝර් බටහිර ලෝකය පිළිබඳව චෝදනාත්මක කෘතියක් පල කර ඇති අතර එහි නම

(20) එතුමා මිය ගිය වර්ෂය සහ මාසය

2) පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි කරන්න.

i) ජන්මෝත්සවය

ii) දේශමාමකත්වය

iii) පෘථුල

iv) උපනිෂද්

v) සමාජ ප්‍රගතිය

vi) ආචීර්ණ කල්පිත

- එම වචන භාවිත කරමින් අර්ථවත් වාක්‍ය ගොඩ නගන්න.

3) පහත සඳහන් අල්පප්‍රාණ අක්ෂර යෙදුණු පද හා මහාප්‍රාණ අක්ෂර යෙදුණු පද ඇතුළත් කොට අර්ථය පැහැදිලි වන සේ අර්ථවත් නිවැරදි වාක්‍ය ගොඩනගන්න.

1) ප්‍රදාන, ප්‍රධාන

2) නිදාන, නිධාන

3) අරුත, අර්ථ

4) ගණ, ඝන

5) අබරණ, ආභරණය

6) අබිබවා, අභිභවා

7) ස්තූපය, ථූපය

8) මදුරු, මධුර

9) බය, භය

10) පතන, ප්‍රාර්ථනා

11) සින්දු, සින්ධූර

පිළිතුරු

Answer

9 ශ්‍රේණිය | සිංහල | ඒකකය : 2

1.

I. 1861 මැයි 07 දින කල්කටාවේ ජොරාසන්කෝ මන්දිරයේදී.
II. ද්වාර්කනාත් තාගෝර්
III. දේවේන්ද්‍රනාත් තාගෝර්
IV. සන්ධ්‍යා සංගීත්
V. සොබා දහමේ පළිගැනීම/ වාල්මිකී ප්‍රතිභා/ භග්න හෘදය
VI. මානසී
VII. ශාන්ති නිකේතනය, 1901 වසරේ දී
VIII. ස්මරන්
IX. කාව්‍ය - කථ ඕ කාහිනී, නෛවේද්‍ය
නාට්‍ය - තැපැල් කන්තෝරුව, අඳුරු කුටියේ රජතුමා
X. ඉන්දියාවේ අනාගතය පිළිබඳව ඔහු කෙරෙහි වූ ප්‍රර්ථනා, මනුෂ්‍ය ස්වභාවය, මරණය මෙන් ම පීඩිත ජනතාව ද ගැන ගැඹුරු සංකල්ප එහි ඇතුළත් වෙයි.
XI. එච්. ජී. වෙල්ස්, එස්රා පවුන්ඩ්, ඩබ්. බී. යේට්ස්
XII. සාධනා
XIII. 1913 වර්ෂයේ
XIV. 1916 දී
XV. විශ්ව භාරතී විශ්වවිද්‍යාලය ලෙස
XVI. හොරණ ශ්‍රී පාලි විද්‍යාලය
XVII. ශ්‍රී ලංකාව, 1934 දී
XVIII. 1940 දී
XIX. ශිෂ්ටාචාරයේ අර්බුදය
XX. 1941 වැන්නෙහි අගෝස්තු මස (හත්වන දින)

2.

I. උපන් දින උත්සවය
II. තම රට පිළිබඳ හැඟීම
III. පුළුල්

IV. හින්දු ධර්ම ග්‍රන්ථයකි. ගුරුවරයා සමීපයේ සිට ඉගෙන ගන්නා ධර්මයකි.

V. සමාජයේ ඉදිරි ගමන/දියුණුව

VI. යල් පිනු/කල් ගිය/ඉපැරණි යුගයට අයත්

- තාගෝර් තුමාගේ ජන්මෝත්සවය අද දිනට යෙදී තිබේ.
- තාගෝර්තුමාගේ ඇතැම් කෘති වලින් එතුමාගේ දේශමාමකත්වය පෙන්නුම් කරයි.
- එතුමා ඉන්දීය සමාජයේ පෘථුල තුළ චරිතයකි.
- ඔහු ඉන්දියාවේ දී උපනිෂද් මුණිවරු මුණ ගැසුණේ ය.
- ඔහු සමාජ ප්‍රගතිය වෙනුවෙන් නොපිරිහෙලා කටයුතු කළේ ය.
- ඔහු ආචීර්ණ කල්පිත අදහස් දරන්නෙකි.

3.

I. ත්‍යාග ප්‍රදාන උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පාසලේ විදුහල්පතිතුමා පැමිණ සිටියේ ය.

II. ඔවුන් නිදාන සිටි ගල යට නිධානයක් ඇති බව ගම්වැසියෝ පැවසූහ.

III. ඔහුගේ අර්ථ සම්පන්න කතාවේ අරුත වටහා ගැනීමට ඇතමෙකුට නොහැකි විය.

IV. ඔහු ඉවතලන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කළේ ය.

V. ඇය වටිනා ආභරණය ගලවා අබරණ පෙට්ටිය තුළට දැමුවා ය.

VI. තරඟය ආරම්භයේ දී තමා අභිභවා ගිය ක්‍රීඩකයාව තරඟය අවසානයේදී නැවත අබිබවා යාමට ඔහු සමත් වූයේ ය.

VII. ගරා වැටී තිබූ ස්තූපය අලුත් වැඩියා කර නව ථූපය ස්ථාපිත කිරීමේ උත්සවයට සියලු සැදැහැවත්හු සහභාගී වූහ.

VIII. මධුර සංගීතයකට සවන් දෙමින් සිටි ඔහු මදුරු කරදරය නිසා පීඩාවට පත් වූයේ ය.

IX. ඔහුගේ භය දුරු කිරීමට ගෙනා යකැදුරා බල්ලා දැක බය වී පලා ගියේ ය.

X. ඔහු තමා සිතන පතන දේ ඉටු කර ගැනීමට නිතරම ප්‍රාර්ථනා කළේ ය.

XI. ඔහු සින්ධූර දේශයෙන් ගෙන්වූ අශ්වයා පිට නැගී මියුරු සින්දු කියමින් ගමන් කළේ ය.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතිය !

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ